**ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 2 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී වැය කර තිබූ රු.991,680 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.**

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

**(අ) ලැබිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 8 ක එකතු වටිනාකම රු.17,127,796 ක් වූ අතර, එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,279,360 ක් වී තිබුණි.**

**(ආ) ගෙවිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට රු.15,365,939 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකමින් රු.14,752,838 ක් කර්මාන්ත ණයහිමියෝ වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.8,698,689 ක් විය.**

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.**

---

ගිණුම් විෂයයන් 2 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.79,293,913 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

---

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| i | 1996 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | සභාවේ වාහන 7 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| ii | 2001 අගෝස්තු 7 දිනැති අංක 15/2001 චක්‍රලේඛයේ 2 වගන්තිය | සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.13,977,226 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.18,127,662 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.4,150,436 ක අඩුවීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

-----------------------

**2.2.1 වරිපනම්.**

----------

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,575,086 ක් වූ අතර, ඉන් වර්ෂය තුළදී රු.682,743 ක් අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කළ ආදායම රු.971,479 ක් වූ අතර, ඉන් රු.682,708 ක් අය කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර ගැනීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 43 ක් හා සියයට 70 ක් වූ අතර, දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.1,181,114 ක් විය. ඒ අනුව, ආදායම් අය කර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. එම ශේෂයෙන් 2017 අප්‍රේල් 30 දින වන විට රු.889,741 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**(ආ) හිඟ වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ ගණනාවක සිට පවතින රාජ්‍ය ආයතන 10 ක රු.278,299 ක් වූ හිඟ වරිපනම් ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයෙන් 2017 අප්‍රේල් 30 දින වන විට රු.161,915 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**(ඇ) වර්ෂ 5 කට වරක් හෝ නව වරිපනම් තක්සේරුවක් සිදු කළ යුතු වුවද, වර්ෂ 9 ක් ඉක්ම ගොස් ඇතත්, 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදීත් ගාස්තු අය කර තිබුණි.**

**(ඈ) 2011 සැප්තැම්බර් 27 දිනැති මහා සභා තීරණයට අනුව, නව වරිපනම් ප්‍රදේශ 5 ක් යටතේ ඒකක 3107 ක් වරිපනම් අය කිරීමට හඳුනා ගෙන ඇතත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**2.2.2 බදු කුලී.**

---------

**(අ) 1998 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ කුරුඳුවත්ත නගරයේ ඉවත් කරන ලද කඩ කාමර හිමියන් 13 දෙනෙකුගේ හිඟ කඩ කුලී ශේෂය රු.138,626 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 6 ක් රු.5,000 ත් රු.25,000 ත් අතර මාසික කුලී මුදලකට වෙනත් පාර්ශවයන්ට අතුරු බදු දී තිබුණි.**

**(ඇ) එක වර අය කිරීම් මුදල් සම්පූර්ණයෙන් අය කිරීමකින් තොරව ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර පවරා තිබූ වෙළඳ සැල්හිමියන් 3 දෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට**

රු.407,000 ක මුදලක් වර්ෂ 6 කට ආසන්න කාලයක සිට හිඟ හිටව පැවතුණි. එම ශේෂයෙන් 2017 අප්‍රේල් 30 දින වන විට රු.383,000 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ඇ) 2016 නොවැම්බර් 08 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක් වර්ෂයකට අධික කාලයක සිට වසා දමා තිබුණු බවක් නිරීක්ෂණය විය.

(ඉ) කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ බදුකරුවන් කඩ කාමර 4 ක් වෙනත් පාර්ශවයන්ට රු.1,520,000 ක මුදලකට විකුණා ඇති බවක් 2016 නොවැම්බර් 18 දින කරන ලද පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. කුරුඳුවත්ත නගරයේ තවත් කඩ කාමර 13 ක් කිසිදු ගිවිසුම්ගතවීමක් හෝ ටෙන්ඩර් කිරීමකින් තොරව රු.1,100 ක මාසික කුලි මුදලකට සමෘද්ධිලාභීන් වෙත ලබා දී තිබූ අතර, සමෘද්ධිලාභීන් 3 දෙනෙකුගේ කඩ කාමර දැනට වර්ෂ 1 ත් 8 ත් අතර කාලයක දී සභාවේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශව වෙත රු.2,000 ත් රු.2,600 ත් අතර කුලී මුදලකට අතුරු බදු දී තිබුණි.

2.2.3 වෙනත් ආදායම්.
--------------------

(අ) අක්කර බදු.
---------------

2016 දෙසැම්බර් 31 දිනට රු.66,283 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර, එකී ශේෂය තුළ වර්ෂ 5 කට වඩා පැරණි රු.24,304 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි.

(ආ) ජල ගාස්තු.
-------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 1999 වර්ෂයේ පමණ ක්‍රියාත්මක වූ දැනට අක්‍රීය වූ ජල යෝජනා ක්‍රම 7 කට අයත් ජල පාරිභෝගිකයින් 104 කගෙන් රු.72,559 ක් වූ හිඟ ජල ගාස්තු 2003 වර්ෂයේ සිට වර්ෂ 13 ක කාලයක් අය කර ගැනීමට හෝ ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii) ජල යෝජනා ක්‍රම අලුත්වැඩියා කිරීමට වාර්ෂික අයවැය ලේඛනයෙන් රු.200,000 ක් වෙන් කරවා ගෙන ඇතත්, අක්‍රීය ජල යෝජනා ක්‍රම යථා තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) දැනට ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රම 2 ක් මගින් පුද්ගලයින් 62 කට ලබා දෙන ජලය ක්ලෝරීන් කිරීමක් කර හෝ පෙරහන් කිරීමක්/ පිරිපහදුවක් සිදු නොකර සෞඛ්‍ය ආරක්ෂිත නොවන පරිදි බෙදා හරිමින් තිබුණි.

(ඇ) දැන්වීම් පුවරු ගාස්තු.

(i) දැන්වීම් පුවරු 36 කින් රු.68,950 ක ආදායමක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ශේෂයෙන් 2017 මැයි 30 දින වන විට රු.30,100 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ii) 2015 වර්ෂයට පෙර සිට පැවත එන රු.48,600 ක ශේෂයක් එටිසලාට් පුද්ගලික සමාගමෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම්.

ලියාපදිංචි ත්‍රී රෝද රථ 45 කින් සමාලෝචිත වර්ෂයට අදාළ රු.148,500 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්මත කර ගෙන ද නොතිබුණි. එම හිඟ ශේෂයෙන් 2017 අප්‍රේල් 30 දින වන විට රු.127,800 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.135,583 ක් හා මුද්දර ගාස්තු රු.2,175,453 ක් අය විය යුතුව තිබුණි. හිඟ උසාවි දඩ ශේෂයෙන් 2017 ජුනි 05 දින වන විට රු.82,500 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

3.1 කාර්යසාධනය.

(අ) සභා අරමුදල් යටතේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම.

(i) සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංවර්ධන යෝජනා 13 ක් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත වර්ෂයේ අවසන් කාර්තුවේ ඉදිරිපත් කර ව්‍යාපෘති

**11 ක් අනුමත කර ගෙන තිබූ අතර, ඉන් ව්‍යාපෘති 3 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ii)** ප්‍රාදේශීය සභාව සංවර්ධන කටයුතු සඳහා පූර්ව වර්ෂයේ දී ව්‍යාපෘති හඳුනා ගැනීමකින් තොරව දළ අගයක් මත වෙන් කර ගෙන තිබූ රු.**10,200,000** ක ප්‍රාග්ධන වැය ප්‍රතිපාදන උපයෝගී කර ගෙන සමාලෝචිත වර්ෂය තුළ දී ව්‍යාපෘති **12** ක් පමණක් ඉටු කර රු.**4,938,731** ක් වැය කර තිබුණි.

**(ආ)** ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකිරීම.

සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් යටතේ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා වැය විෂයයන් **6** කට වෙන් කර තිබූ රු.**170,000** ක ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට උපයෝගී කර ගැනීමකින් තොරව මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණි.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** **2015** ඔක්තෝබර් **28** දින විශ්‍රාම ගොස් සිටි සේවකයෙකුගෙන් අය විය යුතු රු.**57,700** ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** අනු බෙදුම් කළ ඉඩම්වල පොදු කටයුතු වෙනුවෙන් සභාවට වෙන් කර දී ඇති පර්චස් **169.64** ක් වූ තවත් ඉඩම් **4** ක් **2016** නොවැම්බර් **11** දින වන විටත්, සංවර්ධනය කර පොදු කටයුතු වෙනුවෙන් යොදා ගෙන නොතිබූ අතර, මරියාවත්ත එස්ටේට් හිල්ටොප් ගාර්ඩ්න් නමැති අනු බෙදුම් කළ ඉඩමේ පොදු කටයුතු සඳහා වෙන් කර තිබූ පර්චස් **37** ක ඉඩම සඳහා හිමිකම් ඔප්පුව ලබා ගෙන නොතිබුණි.

**3.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා.

සංවර්ධන බලපත්‍ර ලබා ගැනීම සඳහා **2014 - 2016** දක්වා වූ කාලය තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් **381** කින් අයදුම්පත් **235** ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් **25** ක් සඳහා පමණි.

**3.4** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

රු.**614,550** ක් වටිනා වත්කම් අයිතම **3** ක් හා වටිනාකම ගණනය කර නොමැති වත්කම් අයිතම **2** ක් වර්ෂ **1** ත් **5** ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

**3.5** කොන්ත්‍රාත් පරිපාලනය.
---------------------------

අසුපිණි ඇල්ල සංවර්ධන ආකර්ෂණ ව්‍යාපෘතිය.
-----------------------------------------------------

අසුපිණි ඇල්ල සංවර්ධන ආකර්ෂණ ව්‍යාපෘතිය රු.**12,500,000** ක මුදලකට ඇස්තමේන්තු කර ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් සංචාරක දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එසේම, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මධ්‍යම පළාත් වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව විසින් රු.**10,000,000** ක ප්‍රතිපාදන **2016** පෙබරවාරි **24** දින වෙන් කර තිබුණි. **2016** ඔක්තෝබර් **31** දිනට යථෝක්ත ව්‍යාපෘතිය අවසන් කළ යුතු බව **2016** පෙබරවාරි **24** දිනැති අංක **CPC/DTCT/DP/05/02** දරන මධ්‍යම පළාත් වෙළඳ වාණිජ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂකගේ ලිපියෙන් තහවුරු වුවද, **2016** දෙසැම්බර් **31** දින වන විට එකී ව්‍යාපෘතියට ප්‍රවේශ වීමට රු.**1,885,403** ක මාර්ගයක් ඉදි කිරිම ආරම්භ කිරිම හැර, වෙනත් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

**3.6** ව්‍යාපෘති ප්‍රමාද කිරීම.
------------------------

මහ නැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.**1,500,000** ක ප්‍රතිපාදන මත ව්‍යාපෘති **3** ක් වෙනුවෙන් වූ ඉදි කිරිම් කටයුතු **2013** වර්ෂයේ දී ප්‍රජාපාදක සංවිධාන **3** කට පවරා තිබූ නමුත්, **2016** දෙසැම්බර් **31** දින වන විටත් එම ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමට හෝ එකී ගිවිසුම් අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.7** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කුරුඳුවත්ත ප්‍රදේශයේ දිරන කසළ දෛනිකව කි.ග්‍රෑ. **30 – 50** ත් අතර ප්‍රමාණයක් ජීව වායු ඒකකයට යොමු කර තිබූ අතර, දොළොස්බාගේ, උලපනේ ප්‍රදේශවල දිරන, නොදිරන කසළ කි.ග්‍රෑ. **175** කට ආසන්න ප්‍රමාණයක් වර්ග කිරීමකින් තොරව උලපනේ උඩගම පිහිටි කසළ වලකට අවිධිමත්ව බැහැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ සෞඛ්‍ය සේවා යටතේ කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමට රු.50,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇතත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) කුරුඳුවත්ත නගරයේ රැස් කරන දිරන කසළ ජීව වායු ඒකකයට බැහැර කරනු ලබන අතර, ජනිත වන ජීව වායු ඉකුත් වර්ෂයේ සිට අසළ වෙළඳ සැලකට නොමිලයේ ලබා දී තිබුණි.

3.8 පාරිසරික ගැටළු.
-------------------
සභා බල ප්‍රදේශයට අයත් කුරුඳුවත්ත පොදු වැසිකිළිය හා ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිළිය කිසිදු නඩත්තුවකින් හා අලුත්වැඩියා කිරීමකින් තොරව මහජන සෞඛ්‍යයට අහිතකර ආකාරයෙන් පවත්වා ගෙන යමින් පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
-------------------------------------
4.1 අයවැය පාලනය.
-------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභා අරමුදල්වලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගේ ඇස්තමේන්තු ලබා ගෙන අය වැය ඇස්තමේන්තු පිළියෙළ නොකර, රු.10,200,000 ක දළ අගයක් යොදා ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබූ අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් වියෂයයන් 6 ක සියයට 23 සිට සියයට 41 දක්වාද, වියදම් විෂයයන් 5 ක සියයට 24 සිට සියයට 61 දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) වැය විෂයයන් 26 ක් සඳහා සලසා දී තිබූ රු.3,214,350 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.
-------------------------------

**සමාලෝචිත වර්ෂය තුළ රු.12,849,153 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 සංයුක්ත සැළැස්ම.**

**--------------------**

**සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැළැස්ම පිළියෙළ කර නොතිබුණි.**

**4.4 ක්‍රියාකාරි සැළැස්ම.**

**--------------------**

**සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ)** කොන්ත්‍රාත් පරිපාලනය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණයගැතියන් හා ණයහිමියෝ

**(ඉ)** අයවැය පාලනය